# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 12,808 — 1961 දෙසැම්බර් 9 වැනි සෙනසුරාද — 9.12.1961

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (I) වැනි ඡේදය — සාමාන්‍ය

### ආණ්ඩුවේ නිවේදන

**1961 අංක 9 දරන හදිසි (විවිධ විධිවිධාන හා බලතල) නියෝග**

**ආඥාව**

1961 අංක 9 දරන හදිසි (විවිධ විධිවිධාන හා බලතල) නියෝගවල 14 වෙනි නියෝගයෙන් මා වෙත පවරනු ලැබූ බලතල ප්‍රකාර, අගමැති සිරිමාවෝ රත්වත්තේ ඩයස් බණ්ඩාරනායක වන මා විසින්, හැම තේ, රබර් හෝ පොල් වත්තක ම අධිකාරිට—

(අ) මහජන ආරක්ෂාව පවත්වා ගෙන යාම හෝ අත්‍යාවශ්‍ය සේවා පවත්වා ගෙන යාම සම්බන්ධ හෝ එයට අදාළ වන දැන්වීමක්, දැන්වීම් පත්‍රයක් හෝ වෙනත් ප්‍රකාශනයක් වන, ප්‍රවෘත්ති අධ්‍යක්ෂ විසින් ප්‍රදර්ශනය කිරීමේ කාර්යය සඳහා කලින් කලට ඒ අධිකාරී වෙත නිකුත් කරනු ලැබූ හැම දැන්වීමක්, දැන්වීම් පත්‍රයක් හෝ වෙනත් ප්‍රකාශනයක් ඒ වත්තේ ප්‍රකට ස්ථානවල ප්‍රදර්ශනය කිරීමට හෝ ප්‍රදර්ශනය කරවීමට ; හා

(ආ) (ඒ අධිකාරී විසින් කරනු ලැබූ වාචික හෝ ලිඛිත පැහැදිලි කිරීම් ඇතුළු ව) ඒ වත්තෙහි සේවයෙහි යොදවනු ලැබූ හැම තැනැත්තාටම, ඒ දැන්වීමෙහි, දැන්වීම් පත්‍රයෙහි හෝ වෙනත් ප්‍රකාශනයෙහි කරුණු, ඒ අධිකාරීට ඉතාමත්ම සුදුසු ය යි අදහස් වන ආකාරයෙන් නිවේදනය කිරීමට හෝ නිවේදනය කරවීමට මේ ආඥාවෙන් නියම කරනු ලැබේ.

සිරිමා ආර්. ඩී. බණ්ඩාරනායක,
අග්‍රාමාත්‍ය.

1961 දෙසැම්බර් 9.
කොළඹ.


ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.

2275—ජේ. ඇන්. ආර් 256—7,020 (12/61)